RG/NB/1/චක්‍රලේඛ

2019.10. 01

චක්‍ර ලේඛ අංක 13/2019

සියලුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් වෙත,

**ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 35 වගන්තිය යටතේ ලැබෙන ඉල්ලීම සඳහා නියෝග ලබා දීමේ බලය පැවරීම**

01. ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත (117 වන අධිකාරය) යටතේ ලේඛන ලියාපදිංචි කිරීමේදී සිදුවී ඇති දෝෂ නිවැරදි කිරීම සඳහා නියෝග දීමේ බලය එකී ආඥා පනතේ 35 වගන්තිය මගින් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත පැවරී ඇත.

02. ලේඛන ලියාපදිංචි කිරීමේදී සිදුවී ඇති දෝෂ නිවැරදි කිරීම සඳහා ලැබෙන ඉල්ලීම් ප්‍රමාණය දිනෙන් දින වැඩි වීමත්, එම ඉල්ලීම් ඇතුලත් ලිපිගොනු සඳහා ප්‍රධාන කාර්යාලයෙන් පමණක් නියෝග ලබාදීම සිදු කිරීමත් හේතුවෙන් සැලකිය යුතු කාලයක් ඒ සඳහා ගතවේ. මෙමගින් මහජනතාවට හා නොතාරිස්වරුන්ට විවිධ අපහසුතාවන්ට මුහුණ දීමට, සිදු වන බවද වාර්තාවේ. මෙම තත්වය අවම කිරීම සඳහා ලියාපදිංචි කිරීමේ දෝෂ නිවැරදි කිරීමට නියෝග ලබා දීමේ බලය කලාප මට්ටමින් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට නිරික්ෂණය කරන ලදී.

03. ඒ අනුව ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 35 වගන්තිය යටතේ දෝෂ නිවැරදි කිරීම සඳහා නියෝග දීමේ බලය 2019.10.01 දින සිට සියලුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් වෙත පවරමි.

ඉහත කී නිවැරදි කිරීම සඳහා නියෝග ලබා දීමේදී කිසිවෙකුගේ අයිතිවාසිකම් වලට හා ලේඛනයේ පූර්වතාවට බලපෑමක් ඇති නොවන පරිදි, විනිවිද භාවයකින් යුතුව කටයුතු කළ යුතුවේ. නිත්‍යානුකූලව ලේඛන ලියාපදිංචි කිරීමේදී වරදක් හෝ ප්‍රමාද දෝෂයක් සිදු වී තිබේද යන්න පැහැදිලිව අනාවරණය කර ගැනීමෙන් හා ඒ පිළිබඳව ඔබ පෞද්ගලිකව සෑහීමට පත් වීමෙන් අනතුරුව අනුමැතිය ලබා දීමට ද ඔබ වග බලා ගත යුතුවේ.

පනතේ 35 (1),(2),(3) කෙරෙහි ඔබගේ අවධානය යොමු කර මෙම කාර්යය අප්‍රමාදව ඉටු කරන ලෙසද, ඔබට පැවරූ බලය නිසි පරිදි හා විශ්වාසනීය ලෙස භාවිතා කරන ලෙස ද අවධාරණය කරමි.

රෙජිස්ට්‍රාර් ජනරාල් එන්. සී. විතානගේ
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
අංක. 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

O/C

පිටපත්: 01. ලේකම්, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
02. විගණකාධිපති
03. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්
04. සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන්

} දැන ගැනීම සඳහා